රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය
அரசாங்க நிர்வாக மற்றும் முகாமைத்துவ அமைச்சு
Ministry of Public Administration and Management
ආයතන අංශය
தாபனப் பிரிவு
Establishments Division
නිදහස් චතුරශ්‍රය, කොළඹ 07. சுதந்திர சதுக்கம், கொழும்பு 07. Independence Square, Colombo 07.

| දුරකථන / தொலைபேசி / Telephone | ෆැක්ස් / பெக்ஸ் / Fax | ඊ-මේල් / ஈ-மெயில் / E-mail | වෙබ් අඩවිය / இணையதளம் / Website |
|---|---|---|---|
| 011-2696211-13 | 011-2692158 | dge@pubad.gov.lk | www.pubad.gov.lk |


| මගේ අංකය / எனது இல / My No | ඔබේ අංකය / உமது இல / Your No | දිනය / திகதி / Date |
|---|---|---|
| EST/7/ALLOW/05/0029 | ETR/SA/Cir/DGE/14/2014 | 2017.09.18 |

ලේකම්
සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

**සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන පුහුණු පාඨමාලා සඳහා ගෙවනු ලබන දීමනා සංශෝධනය කර ගැනීම**

ඔබගේ සමාංක හා 2017.02.28 දිනැති ලිපිය හා සම්බන්ධ වේ.

02. ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය ද සැලකිල්ලට ගෙන, සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන මූලික පුහුණු පාඨමාලාව සහ සේවාස්ථ පුහුණු පාඨමාලා සඳහා පහත පරිදි දීමනා ගෙවීම අනුමත කරමි. මෙම දීමනා, මෙම කාර්යය සඳහා පමණක් වලංගු වන අතර වෙනත් පාඨමාලා සඳහා අදාළ කර නොගත යුතුය.

**(අ) මූලික පුහුණු පාඨමාලාව සඳහා** දේශන පැවැත්වීම වෙනුවෙන් සම්පත්දායකයින් ලෙස සහභාගී වන නිලධාරීන්ට දිනකට උපරිම පැය 03ක් සහ මසකට පැය 10ක උපරිමයකට යටත්ව පහත කොන්දේසියට අනුව වගුව I පරිදි දීමනා ගෙවිය යුතුය.

I. දේශන පැවැත්වීමට සම්පත්දායක නිලධාරීන් යොදවා ගැනීමේ දී එම නිලධාරීන්ගේ සාමාන්‍ය රාජකාරිවලට බාධාවක් නොවන පරිදි අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අවසරය මත එම නිලධාරීන් සහභාගී කරවා ගත යුතුය.

වගුව I

| | තනතුර | අනුමත දීමනාව (පැයකට) |
|---|---|---|
| 01. | ශ්‍රී ලංකා පරිපාලන සේවය හා සමාන්තර දීප ව්‍යාප්ත සේවාවල I ශ්‍රේණියේ නිලධාරීන් සඳහා | රු. 900/- |
| 02. | ශ්‍රී ලංකා පරිපාලන සේවය හා සමාන්තර දීප ව්‍යාප්ත සේවාවල II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා | රු. 800/- |
| 03. | ශ්‍රී ලංකා පරිපාලන සේවය හා සමාන්තර දීප ව්‍යාප්ත සේවාවල III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා | රු. 700/- |
| 04. | උපාධිධාරීන් සඳහා | රු. 600/- |
| 05. | අනෙකුත් සුදුසුකම් සහිත දේශකයන් සඳහා | රු. 500/- |

DDG / ETR
CA

(ආ) **සේවාස්ථ පුහුණු පාඨමාලා සඳහා** මගේ සමාංක හා 2017.06.06 දිනැති ලිපියට වැඩිමනත් ලෙස සහ **මූලික පුහුණු පාඨමාලාව සඳහා** මෙම පුහුණු පාඨමාලා සංවිධානය කරනු ලබන සහ සහායක සේවාවන් ඉටු කරනු ලබන නිලධාරීන්ට එම කාර්යය ඔවුන්ගේ සාමාන්‍ය රාජකාරි සේ සලකා කටයුතු කළ යුතු අතර ඒ වෙනුවෙන් වෙනත් කිසිදු දීමනාවක් නොගෙවීමට යටත්ව ආයතන සංග්‍රහයේ VIII පරිච්ඡේදයේ විධිවිධාන හා 2013.10.07 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 21/2013 ප්‍රකාරව අදාළ පරිදි නිවාඩු දින වැටුප් හෝ අතිකාල දීමනා ගෙවිය යුතුය.

03. එසේම මෙම දීමනා ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ආයතනය තුළ තිබිය යුතු අතර මහා භාණ්ඩාගාරයෙන් අතිරේක ප්‍රතිපාදන නොඉල්ලිය යුතු බව ද කාරුණිකව දන්වා සිටිමි.

ඩබ්ලිව්. ඩී. සෝමදාස
ආයතන අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්: 1. විගණකාධිපති

2. ලේකම්
ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව - ඔබගේ අංක NSCC/3/15/AL/ii හා 2017.07.11දිනැති ලිපිය අනුව දැ.ගැ.ස.